" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / General Telephone } 011 - 2093000

ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/30-38/FI/01
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2025.03.28

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/H/VET/10-8 හා 2024.12.31 දිනැති ලිපිය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.03.24 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2025 හා 2025.01.31 | 2025 රාමලාන් (රාමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබා දීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2025 හා 2025.01.31 | ජල ගැලීම් / ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු ලබා දීම - 2024 නොවැම්බර් |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2011 (i) හා 2025.01.29 | විනය පරීක්ෂණ සඳහා අවශ්‍ය ඡායාස්ථ පිටපත් ලබා දීමේදී අය කළ යුතු ගාස්තු |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 හා 2025.01.20 | රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම |

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 05. | - | පළාත් මාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අංක WP/MPR/ADM/2/24(V) හා 2025.01.20 දිනැතිව යොමු කරන ලද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/H/VET/10-8 හා 2024.12.31 දිනැතිව "ආදායම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වාහන විමෝචන සහතිකයේ වලංගු කාලය දීර්ඝ කිරීම" මැයෙන් වූ ප්‍රධාන ලේකම්වරුන් අමතන ලද ලිපිය |
| 06. | ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/2/2025 හා 2025.02.18 | රාජ්‍ය ආයතන වල අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම |
| 07. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/2025 හා 2025.02.21 | ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ XII වැනි පරිච්ඡේදයේ 8:5 උප වගන්තිය සංශෝධනය කිරීම |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස කාර්යාලයේ ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එස්.එම්.එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරි (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත

එස්.එම්.එච්. කුසුම්සිරි,
පරිපාලන නිලධාරි
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092607
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

01 - xviii

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2025

මගේ අංකය : EST-6/03/LEA/3125
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.01.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2025 රාමලාන් (රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම

මෙවර රාමලාන් (රාමසාන්) සමය 2025 මාර්තු 01 දින ආරම්භ වී 2025 මාර්තු 30 දින අවසන් වීමට නියමිත බැවින්, එම කාල සීමාව තුළ දී මුස්ලිම් නිලධරයන්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා සහ ආගමික කටයුතු දිනපතා සිදුකෙරෙන කාලවේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

* පෙරවරු 03.30 සිට පෙරවරු 06.00 දක්වා
* පස්වරු 03.15 සිට පස්වරු 04.15 දක්වා
* පස්වරු 06.00 සිට පස්වරු 07.00 දක්වා
* පස්වරු 07.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවක දී ම එම නිලධරයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස් කර දිය යුතු ය. නොවැළැක්විය හැකි අවස්ථාවල දී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රාමලාන් (රාමසාන්) අවසන් වීමට දින 14කට කලින් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධරයන්ට උත්සව අත්තිකාරම ලබා දීමට ද කරුණාකර කටයුතු කරන්න.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2699399
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk